තිදෙනෙකු පිළිබඳ (ලිවීමෙන්) පන්හි ද ඉවත් කරනු ලැබීය. නිදන්නා නින්දෙන් අවදිවන තුරු, ළඳරුවා වැඩිවියට පත් වන තුරු, උන්මත්තකයා සිහිබුද්ධිය ලබන තුරු

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අලී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "තිදෙනෙකු පිළිබඳ (ලිවීමෙන්) පන්හි ද ඉවත් කරනු ලැබීය. නිදන්නා නින්දෙන් අවදිවන තුරු, ළඳරුවා වැඩිවියට පත් වන තුරු, උන්මත්තකයා සිහිබුද්ධිය ලබන තුරු"
[පූර්ව සාධක සහිත හදීසයකි]

මෙම පුද්ගලයින් තිදෙනා හැර ආදම්ගේ දරුවන් වන සෙසු මිනිසුන් හට වගකීම් පැවරෙන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. කුඩා දරුවා, ඔහු වැඩිවියට පත් වන තුරු. ස්වබුද්ධිය අහිමි වූ උන්මත්තකයා, ඔහුට සිහිබුද්ධිය නැවත ලැබෙන තුරු. නිදන්නා, ඔහු නින්දෙන් අවදිවන තුරු. වගකීම් සම්බන්ධයෙන් වනාහි, ඔවුන්ගෙන් ඒවා නිදහස් කර ඇත. ඔවුන් සිදු කරන පාපයන් ඔවුනට එරෙහිව ලියනු ලබන්නේ නැත. නමුත් කුඩා දරුවන්ට යහපත ලියනු ලැබේ. උන්මත්තකයා හා නිදා සිටින්නාට එසේ ලියනු නොලබන්නේ ඔවුන් එම තත්ත්වයේ පමණක් ඔවුන්ගේ හැඟීම් ඉවත්ව ඇති බැවින් නැමදුම පිළි නොගන්නා අය අතරට ඔවුන් පත්ව සිටින බැවිනි.

https://sunnah.global/hadeeth/si/show/58148